# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1651/24 - 2010 මැයි 02 වැනි ඉරිදා - 2010.05.02**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

සී.එෆ් 1/64

**මහජන ආරක්ෂක ආඥාපනත ( 40 වන අධිකාරය )**

(40 වන අධිකාරය වන) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2010 මැයි මස 02 වැනි දින,
කොළඹ දී.

නියෝග

මහජන ආරක්ෂක පනතේ 2අ වගන්තියේ විධිවිධාන ප්‍රකාර බලාත්මකව පවතින බවට සලකනු ලබන්නාවූ ද, කලින් කළ සංශෝධනය කරනු ලැබුවාවූ ද, 2005 අගෝස්තු මස 13 වන දින දරන අංක 1405/14 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පලකරනු ලැබූ 2005 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) නියෝගය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම නියෝග වල 8 වන නියෝගය ඉවත් කිරීමෙන් ;

(2) එම නියෝග වල 12,13,14,15 සහ 16 වන නියෝග ඉවත් කිරීමෙන් ;

(3) එම නියෝග වල 18 වන නියෝගයේ,

*(අ)* එහි *(ආ)* අනුඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"*(ආ)* මේ නියෝගවල 40 වන නියෝගයේ (2) වන ඡේදයේ (අ) හෝ (ආ) උපඡේදවල හෝ 71 වන නියෝගයේ (3) වන ඡේදයේ හෝ විධිවිධානවලට පටහැනි වූ ආකාරයට ක්‍රියා කිරීමෙන් ;"

*(ආ)* එම නියෝගයේ (1) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"*(1අ).* (1) වන ඡේදය යටතේ කරනු ලබන සෑම නියමයක්ම මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය.";

(4) එම නියෝග වල 19 වන නියෝගයේ, (1) වන ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් :-


1A - G 012498—1680 (2010/05)

*(අ)* එහි *(ආ)* උපඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන් :-

"*(ආ)* 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විධිවිධානවලට පටහැනිව කවර හෝ ආකාරයකට ක්‍රියා කිරීම.";

*(ආ)* එම වගන්තියේ අතුරු විධානයේ "එක් අවුරුද්දක් ඉක්මවන කාලසීමාවක් සඳහා" යන වචන වෙනුවට "මාස තුනක් ඉක්මවන කාලසීමාවක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ;

*(ඇ)* එහි *(1අ)* ඡේදයේ අතුරු විධානය වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :-

"එසේ වුවද, (1) වන ඡේදයේ විධිවිධාන යටතේ යම් තැනැත්තෙකු රඳවා තබාගෙන සිටින අවස්ථාවක එකී රඳවා තබාගැනීම පිළිබඳව එසේ රඳවා තබාගත් කාලයේ සිට පැය හැත්තෑ දෙකක් ඇතුළත මහේස්ත්‍රාත්වරයකුට දැනුම් දිය යුතු අතර, සැකකරු එකී රඳවා තබා ගැනීමේ දිනයෙන් එක් මාසයක් ඉකුත් වීමට පෙර මහේස්ත්‍රාත්වරයකු වෙතට ඉදිරිපත් කළ යුතු ය.";

*(ඈ)* *(1අ)* ඡේදයේ දෙවන අතුරු විධානය වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :-

"එසේම තවදුරටත්, නීතිපතිවරයාගේ පූර්ව ලිඛිත අවසරය ලබානොගෙන මහේස්ත්‍රාත්වරයා විසින් කිසිඳු තැනැත්තකු ඇප මත නිදහස් නොකළ යුතු ය.";

*(ඉ)* එහි *(1ඇ)* ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

*(ඊ)* එහි (4), (5), (6), (7), (8) සහ (9) වන ඡේද ඉවත් කිරීමෙන් ;

(5) එම නියෝගවල (20) වන නියෝගයේ, (1) වන ඡේදයේ " වරෙන්තුවක් නොමැතිව එකී තැනැත්තකු සිරභාරයට ගත හැකි ය" යන වචන වෙනුවට, පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් :-

"සිරභාරයට ගත හැකි යඃ

එසේ වුවද, යම් නිවාස ස්ථානයක් සෝදිසි කිරීම අවශ්‍ය වූ විටෙක, එය, උප පොලිස් ස්ථානාධිපතිවරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන්නා වූ නිලධරයකු ඉදිරිපිට දී කළ යුතු වන්නේ ය.";

(6) එම නියෝගවල 21 වන නියෝගය (2008 අගෝස්තු මස 5 වන දින සහ අංක 1561/11 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පලකරන ලද නියෝගය මගින් ඇතුළත් කරනු ලැබූ) ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් ඃ-

"19 වන නියෝගය යටතේ සිරභාරයට ගනු ලැබූ සහ රඳවා තබාගනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් වූ විශේෂ විධිවිධාන.

(21) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 36, 37 සහ 38 වන වගන්තිවල විධිවිධාන 19 වන නියෝගය යටතේ සිරභාරයට ගනු ලබන තැනැත්තකුට අදාළ නොවිය යුතු ය ඃ

එසේ වුවද, මේ නියෝගවල 19 වන නියෝගයේ විධිවිධාන යටතේ යම් තැනැත්තකු සිරභාරයට ගෙන රඳවා තබා ගනු ලැබූ අවස්ථාවක, එකී තැනැත්තා, එක් එක් සිද්ධියේ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු සහ කෙසේ වුවද එකී සිරභාරයට ගැනීමෙන් පසු දින තිහක් ඉකුත්වීමට පෙර සාධාරණ කාලයක් ඇතුළත මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ යුතු යඃ

එසේම තවදුරටත්, මහේස්ත්‍රාත්වරයා විසින්, නීතිපතිවරයාගේ පූර්ව ලිඛිත අවසරය ලබා නොගෙන කිසිදු තැනැත්තකු ඇපමත මුදානොහැරිය යුතු යඃ

එසේ වුවද, මේ නියෝගයේ විධිවිධානවලට අනුකූලව යම් තැනැත්තකු ඉදිරිපත් කිරීම එකී තැනැත්තා (2) වන ඡේදය යටතේ රඳවා තබාගැනීමකට බලපෑමක් නොවන්නේ ය.

(2) පොලිස්පතිවරයා විසින් අවසරදෙනු ලැබූ ස්ථානයක දී 19 වන නියෝගයේ විධිවිධාන අනුව රඳවා තබා ගනු ලැබූ යම් තැනැත්තකු, එකී නියෝගය යටතේ ඒ තැනැත්තා සිරභාරයට ගත් දින සිට ගණන් ගනු ලබන දින තිහක කාලයක් නොඉක්මවන කාලයක් සඳහා එසේ රඳවා තබා ගැනීම කළ හැකි අතර, එකී ස්ථානය භාර නිලධරයා විසින් එකී කාලය අවසන් වීමට පෙර නිසි අධිකරණ බලය සහිත අධිකරණයක් වෙත ඒ තැනැත්තා ඉදිරිපත් කරනු ලැබුවේ නම් මිස, එකී කාලය අවසානයේ දී එකී ස්ථානභාර නිලධරයා විසින් ඒ තැනැත්තා මුදාහරිනු ලැබිය යුතු ය. තවද, එකී තැනැත්තා බන්ධනාගාර ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ බන්ධනාගාරයක් තුළ රඳවා තබාගෙන ඇති අවස්ථාවක -

*(අ)* එකී ආඥාපනතේ IX වන කොටසේ විධිවිධාන හැර එකී ආඥාපනතේ අන් සියලු විධිවිධාන ; සහ

*(ආ)* සිරකරුවන් බැලීමට පැමිණීම සහ ඔවුන් සමග ලිපි ගණුදෙනු කිරීමට අදාළ රීති හැර එකී ආඥාපනත යටතේ සාදන ලද අන් සියලු රීති ද

එකී තැනැත්තා එකී ආඥාපනතේ අර්ථය ඇතුළත සිවිල් සිරකරුවකු වූවා සේ ඒ තැනැත්තාට අදාළ විය යුතු යඃ

එසේ වූවද, පොලිස්පතිවරයා විසින්, එසේ කිරීම සුදුසුවන්නේ යැයි සලකනු ලබන විටෙක,

*(අ)* නියමයක් මගින්, මේ ඡේදයේ මුලින් සඳහන් විධිවිධාන යටතේ එකී තැනැත්තාට අදාළ වන්නා වූ, එකී ආඥාපනතේ යම් විධිවිධාන හෝ ඒවා යටතේ සාදන ලද යම් රීති එසේ අදාළ නොවිය යුතු බවට, හෝ එම නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන සංශෝධන හෝ මඳ වශයෙන් කරනු ලබන වෙනස් කිරීම්වලට හෝ යටත්ව අදාළ විය යුතු බවට හෝ විධාන කරනු ලැබිය හැකි ය; සහ

*(ආ)* එකී පොලිස්පතිවරයා විසින් කලින් කළ විධාන කරනු ලබන පරිදි වූ ආකාරයට සහ, වේලාවලදී සහ ස්ථානයන් හි දී එකී තැනැත්තා බැලීමට පැමිණීමට සහ ලිපිගනුදෙනු කිරීමට අවසර දෙනු ලැබිය හැකි ය.

(3) 19 වන නියෝගය යටතේ සිරභාරයට ගනු ලැබූ සහ රඳවා තබා ගනු ලැබූ යම් තැනැත්තකු (2) වන ඡේදයේ සඳහන් කරනු ලැබ ඇති නිලධරයා විසින් නිසි අධිකරණ බලය සහිත අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ විටෙක, එකී අධිකරණය විසින්, එකී තැනැත්තා බන්ධනාගාර ආඥාපනත යටතේ පිහිටුවන ලද බන්ධනාගාරයක ෆිස්කල්වරයකුගේ භාරයේ රඳවා තබාගනු ලැබිය යුතු බවට නියෝග කළ යුතු ය.

(4) මේ නියෝගයේ " පොලිස්පතිවරයා" යන්නට, යම් නියෝජ්‍ය පොලිස්පතිවරයකු හෝ පොලිස් අධිකාරීවරයකු හෝ සහකාර පොලිස් අධිකාරීවරයෙකු හෝ ඇතුළත් වේ.";

(7) එම නියෝගවල 23 වන නියෝගය ඉවත් කිරීමෙන් ;

(8) එම නියෝගවල 25, 26 සහ 27 වන නියෝග ඉවත් කිරීමෙන් ;

(9) එම නියෝගවල 28, 29, 30, 31, 32 සහ 33 වන නියෝග ඉවත් කිරීමෙන් ;

(10) එම නියෝගවල 34 වන නියෝගය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"යුද්ධායුධ, පීඩාකාරී ආයුධ සහ තුවක්කු, යනාදිය රැස් කිරීම.

34. (1) යුද්ධායුධ, වෙඩිබෙහෙත්, පුපුරණ ද්‍රව්‍ය හෝ පීඩාකාරී ආයුධ හෝ වෙනත් අන්තරායදායක භාණ්ඩ හෝ ද්‍රව්‍ය රැස්කරන, ප්‍රවාහනය කරන හෝ ප්‍රවාහනය කිරීමට සලස්වන හෝ ඒවා නීති විරෝධී ලෙස සන්තකයේ තබාගන්නා, නැතහොත් එවැනි යම් යුද්ධායුධ, වෙඩිබෙහෙත්, පුපුරණ ද්‍රව්‍ය, පීඩාකාරී ආයුධ, අන්තරායදායක භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ භාවිත කිරීම සඳහා යම් තැනැත්තකු සූදානම් කරන, පුහුණු කරන හෝ පුහුණු කිරීමට සූදානම් කරන කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු වන අතර වරදකරු කිරීමේදී බරපතල වැඩ සහිත අවුරුදු පහළොවකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(2) පොලිස් නිලධරයකු හෝ කෝප්‍රල් තත්ත්වයට අඩු නොවූ තත්ත්වයන් දරන්නා වූ ශ්‍රී ලංකා යුධ හමුදාවේ යම් සාමාජිකයකු හෝ නායක නැවියකුගේ තත්ත්වයට අඩු නොවූ තත්ත්වයක් දරන්නා වූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධරයකු හෝ කෝප්‍රල් තත්ත්වයට අඩු නොවූ තත්ත්වයක් දරන්නා වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධරයකු හෝ විසින් මේ නියෝගය යටතේ වූ වරදක් කරන්නේ යැයි විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතුවක් ඇති යම් තැනැත්තකු සන්තකයේ ඇති හෝ ඒ තැනැත්තාගේ පාලනය යටතේ ඇති යම් තුවක්කුවක්, පුපුරන ද්‍රව්‍යයක්, පීඩාකාරී ආයුධයක්, අන්තරායදායක භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් ඒ තැනැත්තා වෙතින් ඉවත් කිරීම කරනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකු මේ නියෝගය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක -

*(අ)* එකී තැනැත්තාගේ චංචල හෝ නිශ්චල සියලු දේපළ ;

*(ආ)* එකී වරද සිදු කිරීම හා සම්බන්ධව භාවිත කරනු ලැබූ යම් වාහනයක් හෝ නාවික යාත්‍රාවක්

එකී වරදකරු කිරීම ප්‍රකාර, කිසිඳු බැඳීමකින් තොරව ජනරජය සතු කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(4) (3) වන ඡේදය යටතේ රජය සතු කරනු ලැබූ යම් දේපළක් -

*(අ)* අදාළ වරදකරු කිරීමට එරෙහිව අභියාචනා අධිකරණයට අභියාචනයක් ඉදිරිපත් නොකරනු ලැබුවේ නම්, එකී වරදකරු කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ කාලය අවසන් වන දින සිට බලපැවැත්වෙන පරිදි, පූර්ණ වශයෙන් රජය සතු විය යුතු ය ;

*(ආ)* අදාළ වරදකරු කිරීමට එරෙහිව අභියාචනා අධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබුවේ නම්, එකී වරදකරු කිරීම එකී අභියාචනයේ දී ස්ථිර කරනු ලැබූ දින සිට බලපැවැත්වෙන පරිදි, පූර්ණ වශයෙන් රජය සතු විය යුතු ය.

මේ ඡේදයේ "අදාළ වරදකරු කිරීම" යන්නෙන්, (3) වන ඡේදය යටතේ යම් දේපළක් රජය සතු කරනු ලබන්නේ යම් වරදකරු කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් ද, එකී වරදකරු කිරීම අදහස් වේ.

(5) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 සහ 306 වන වගන්තිවල විධිවිධාන මේ නියෝගය යටතේ කරනු ලැබූ වරදකරු කිරීමක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(6) මේ නියෝගයේ -

"පීඩාකාරී ද්‍රව්‍ය" යන්නෙන්, යම් ගිනි ගන්නා සුළු, විබාදන හෝ ප්‍රචණ්ඩකාරී ද්‍රව්‍යයක් අදහස් වේ;

"පීඩාකාරී අවි" යන්නෙන්, බෝම්බයක් හෝ අත්බෝම්බයක් අදහස් වනුයේ යම් කාර්යයක් සඳහා ද එකී කාර්යය හා සමාන කාර්යය සඳහා භාවිත කිරීමට සාදන ලද වෙනත් යම් උපක්‍රමයක් හෝ නිර්මාණයක් හෝ, යම් පුද්ගලයකුට හෝ යම් දේපළකට කායික තුවාල සිදුකිරීම සඳහා භාවිත කිරීමට හැකියාවක් ඇති යම් භාණ්ඩයක් හෝ අදහස් වන අතර, එවැනි යම් බෝම්බයක, අත්බෝම්බයක, උපක්‍රමයක හෝ නිර්මාණයක කොටසක් විය හැකි යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් ද ඊට ඇතුළත් වේ.";

11. එම නියෝග වල 35 වන සහ 36 වන නියෝග ඉවත් කිරීමෙන් ;

12. එම නියෝග වල 37, 38 සහ 39 වන නියෝග ඉවත් කිරීමෙන් ;

13. එම නියෝග වල 41 වන නියෝගය ඉවත් කිරීමෙන් ;

14. එම නියෝග වල 46, 47, 48 සහ 49 වන නියෝග ඉවත් කිරීමෙන් ;

15. එම නියෝග වල 54, 55, 56, 57 සහ 58 වන නියෝග ඉවත් කිරීමෙන් ;

16. එම නියෝග වල 63, 64 සහ 65 වන නියෝග ඉවත් කිරීමෙන් ;

17. එම නියෝග වල 67 වන නියෝගය ඉවත් කිරීමෙන් ;

18. එම නියෝග වල 70 වන නියෝගය ඉවත් කිරීමෙන් ;

19. එම නියෝග වල 71 වන නියෝගය, එහි (ආ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

> "(ආ) 40 වන නියෝගයේ (2) වන ඡේදයේ (ආ) උපඡේදයේ සඳහන් කවර හෝ කාර්යයන් සඳහා සහ 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විධිවිධානවල කාර්ය සඳහා.";

20. මේ නියෝගවල විධිවිධානවල ඇතුළත් කිසිවක් මගින්, කලින් කළ සංශෝධනය කරනු ලැබූ 2005 අගෝස්තු මස 13 වන දින සහ අංක 1405/14 *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 2005 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) නියෝගය ප්‍රකාර, යම් තැනැත්තකු සිරභාරයට ගැනීම, රඳවා තබාගැනීම හෝ වරදකරු කිරීමකට හෝ එකී නියෝගය අනුව කරනු ලැබූ යම් දේපළ පැවරීමකට හෝ රජය සතු කිරීමකට හෝ එකී නියෝගයේ විධිවිධාන අනුව කරනු ලැබූ යම් නියමයකට හෝ එකී නියෝගයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කරනු ලැබූ කවර හෝ දෙයකට හෝ බලපෑමක් සිදුවන බවට තේරුම් නොගත යුතු ය.

21. මේ නියෝගයේ ඇතුළත් කිසිවක් මගින්, මේ නියෝගය බලාත්මක වීමට පෙර 18 වන නියෝගය යටතේ කරන ලද යම් සීමාකිරීමේ නියමයකට හෝ 19 වන නියෝගය යටතේ කරන ලද යම් රඳවාගැනීමේ නියමයකට බලපෑමක් සිදු නොවිය යුතු බවට ද, 2005 අගෝස්තු 13 වන දින අංක 1405/14 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2005 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) නියෝගයේ විධිවිධාන එකී නියෝගයට මෙයින් කරන ලද සංශෝධන නොතකා, එවැනි තැනැත්තන් සම්බන්ධයෙන් බලපැවැත්වීම දිගටම සිදුවිය යුතු බවට ද සැකදුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.